Mathematics.lk

FOR FUTURE EDUCATION IN SRI LANKA

Sri Lanka First and Only Mathematics Educational Website

Visit Our Website for More;

© LAHIRU KADURUGAMUWA EDUCATIONAL FOUNDATION

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

11450

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) ලංකාවේ දේශපාලන ඉතිහාසයට මුල්තැන දෙමින් රචනා කරන ලද ග්‍රන්ථය මින් කුමක් ද?

(1) රසවාහිනිය (2) රාජාවලිය (3) දීපවංසය (4) නිකාය සංග්‍රහය

(02) ශිලා ලේඛන ලිවීම අඛණ්ඩව සිදු වූ කාල වකවානුව වන්නේ,

(1) මහසෙන් රජ සමයේ සිට දඹදෙණි රාජ්‍ය සමය අවසානය දක්වා ය.

(2) ක්‍රි. ව. දෙවන සියවසේ සිට ගම්පොළ රාජ්‍ය සමය දක්වා ය.

(3) ක්‍රි. පූ. දෙවන සියවසේ සිට මහනුවර රාජ්‍ය සමය දක්වා ය.

(4) දේවානම්පියතිස්ස රජසමයේ සිට කෝට්ටේ රාජ්‍ය සමය දක්වා ය.

(03) ග්‍රීක රෝමානුවෙකු වීම, ඇලෙක්සැන්ඩ්‍රියාවේ ජීවත්වීම, භූගෝල ශාස්ත්‍රඥයෙකු වීම. යන තොරතුරුවලට සම්බන්ධ පුද්ගලයා වනුයේ,

(1) ෆර්නාඕ ඩි ක්වෙරෝස් ය. (2) මෙගස්තිනිස් ය.

(3) පිලිප්පස් බැල්ඩියස් ය. (4) ක්ලෝඩියස් ටොලමි ය.

(04) පූර්ව ඓතිහාසික යුගයේ වැසියන්ට තම එදිනෙදා කටයුතු වඩාත් කාර්යක්ෂම කරගැනීමේ හැකියාව උදාවූයේ කුමන සිදුවීම සමඟ ද?

(1) යකඩ ලෝහය භාවිතය ආරම්භ වීම (2) සකපෝරුව නිර්මාණය කිරීම

(3) මැටි වළං නිෂ්පාදනය කිරීම (4) ස්ථිර නිවාස සකස් කර ගැනීම

(05) මීට වසර 80000කට පෙර භාවිතා වූ ගල් මෙවලම් සහිත බොරළු තට්ටුවක් හඳුනාගෙන ඇත්තේ,

(1) අලිගලිනි. (2) පතිරාජවෙලෙනි.

(3) වැල්ලෙගංහොඩිනි. (4) මාතොටිනි.

(06) - චෝළ පාලනයට එරෙහිව කටයුතු කිරීම

- පරිපාලන සංවිධානය විධිමත් කිරීම

- ගොකණ්ණතිත්ථ වරායේ වෙළඳ කටයුතු පහසුවෙන් පාලනය කිරීම

ඉහත තොරතුරු හා සම්බන්ධ රජතුමා වූයේ කවුරුන් ද?

(1) දුටුගැමුණු රජු (2) පළමුවන විජයබාහු රජු

(3) පණ්ඩුකාභය රජු (4) පළමුවන පරාක්‍රමබාහු රජු

(07) පහත දැක්වෙන ඓතිහාසික සිදුවීම් අතුරින් වසභ රජතුමා හා සම්බන්ධ සිදුවීම් පමණක් දක්වා ඇති පිළිතුර තෝරන්න.

A. රුවන්වැලි සෑයේ සතර දොරටුවේ දන්සැල් පැවැත්වීම

B. චීනය සමඟ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පැවැත්වීම

C. විශාල ප්‍රමාණයේ වැව් ඉදිකිරීම

D. ප්‍රාදේශීය පාලනය විධිමත් කිරීම

E. ශ්‍රී ලංකාව පෙරදිග ධාන්‍යාගාරය කරවීම

F. අන්තර් කලාපීය අවශ්‍යතා වෙනුවෙන් රට සූදානම් කිරීම

(1) CDF (2) DEF (3) ACB (4) CEF

(08) සෙල්ලිපිවල සඳහන් වන පැරණි ප්‍රාදේශීය මායිම් පෙන්වන සංකේත පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) වටාපත, ඉරහඳ, ඔටුන්න
(2) ඇත්අඩිය, හංසයා, නෙළුම් මල
(3) ගොන් කුරය, ගජසිංහ, අන්නාසිමල
(4) දුන්න, ඊතලය, හක්ගෙඩිය

(09) පහත සඳහන් සිදුවීම් ඓතිහාසික අනුපිළිවෙළින් පෙළගස්වා ඇති පිළිතුර වන්නේ,

A. හතරවන කාශ්‍යප රජු උණ රෝගීන්ට රෝහලක් සෑදීම

B. භාතිකාභය රජු රෝමානුක දේශයෙන් වීදුරු පබළු ගෙන්වීම

C. පළමුවන විජයබාහු රජු තිලෝක සුන්දරී කුමරිය විවාහ කර ගැනීම

D. පොළොන්නරු රාජ්‍යය කල්‍යාණවතී රැජිණට බාරදීම

(1) BCAD (2) BACD (3) DCAB (4) CBDA

(10) පුරාණ කවීන් බුදුදහමෙන් ලද හික්මීම හා පරිසර අත්දැකීම තුළින් කාව්‍යකරණයේ යෙදුන බවට දියහැකි උදාහරණයක් වන්නේ,

(1) ලෝකෝපකාරයයි
(2) අභයගිරි විහාර සෙල්ලිපියයි.
(3) කිරින්ද පර්වත ලිපියයි.
(4) මැදිරිගිරිය සෙල්ලිපියයි.

(11) ස්වභාවික භූමියේ බෑස්ම ඉතා සියුම්ව යොදාගනිමින් නිර්මාණය කළ විශ්මිත ඇළ මාර්ගය වන්නේ මින් කුමක් ද?

(1) මිනිපේ ඇළ
(2) ඇළහැර ඇළ
(3) යෝධ ඇළ
(4) පබ්බතන්ත ඇළ

(12) සීගිරි ජල මල් සඳහා යොදා ඇති ගල් පතුරේ සිදුරුවල විශ්කම්භ තුළින් සිදුකර ඇත්තේ,

(1) පීඩනය තුළින් එසවන ජල පහරේ උස වෙනස් කිරීමයි.

(2) වේගවත් ජල පහරක් ලබා ගැනීමයි.

(3) ගලා එන ජලයේ පීඩනය අඩු කිරීමයි.

(4) ගලා එන ජලයේ පීඩනය වැඩි කිරීමයි.

(13) ලංකා ඉතිහාසයේ අමුණක් සෑදීම පිළිබඳ පැරණිම තොරතුරු ලබාදෙන ඔය කුමක් ද?

(1) කිරිඳි ඔය
(2) දැදුරු ඔය
(3) ගල්ඔය
(3) කුඹුක්කන් ඔය

(14) සහස්සවත්ථුපකරණ ග්‍රන්ථයේ සඳහන් වන පරිදි දෙමාපියන් තම දියණියන් වෙනුවෙන් ඉටු කළ යුතු වගකීමක් වන්නේ,

(1) උසස් අධ්‍යාපනයක් ලබාදීමයි.
(2) සූප ශාස්ත්‍රයේ නිපුණ කරවීමයි.
(3) සුදුසු විවාහයක් කරදීමයි.
(4) රූපලාවණ්‍ය කටයුතුවලට යොමු කිරීමයි.

(15) - රජ වාසල කුමන්ත්‍රණයකින් රජු ජීවිතක්ෂයට පත්වීම
- කාලිංගරායරගේ ආක්‍රමණය සිදුවීම
- වන්නි නායකවරුන්ගේ කැරලි ඇතිවීම

ඉහත තොරතුරු අයත්වන්නේ කුමන රාජධානි සමයක ද?

(1) යාපහුව (2) ගම්පොළ (3) කෝට්ටේ (4) දඹදෙණි

(16) දඹදෙණිය, කුරුණෑගල, කෝට්ටේ නගර සම්බන්ධයෙන් වඩාත් ගැළපෙන ප්‍රකාශය සඳහන් පිළිතුර තෝරන්න.

(1) රජරට අයත් රාජධානිවල පාලන මධ්‍යස්ථානවේ.
(2) මායාරටට අයත් රාජධානිවල පාලන මධ්‍යස්ථාන වේ.
(3) මලය රටට අයත් රාජධානිවල පාලන මධ්‍යස්ථාන වේ.
(4) රුහුණු රටට අයත් රාජධානිවල පාලන මධ්‍යස්ථාන වේ.

(17) පහත දැක්වෙන අ සහ ආ තීරු නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර කුමක් ද?

| "අ" | "ආ" |
|---|---|
| 1. රටවසම | A. මහ අදිකාරම |
| 2. රාජසභාව | B. දියවඩන නිලමේ |
| 3. විහාර දේපළ | C. කව්කාර මඩුවේ මුහන්දිරම |
| 4. මහවාසල | D. මහ දිසාවේ |

(1) ACBD (2) CDBA (3) DABC (4) DCBA

(18) උඩරට රාජධානි සමයේ පැවති ආර්ථිකය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) ස්වංපෝෂිත ආර්ථික රටාවක් විය.
(2) කුල ක්‍රමය මත සමාජ සබඳතා පැවතිණි.
(3) වැඩි ඉඩම් ප්‍රමාණයක් හේන් වගාවට යෙදවිණි.
(4) ශිල්ප ශ්‍රේණි මත පදනම් වූ කර්මාන්ත තිබිණි.

**පහත වගුවේ සඳහන් A සිට I දක්වා තොරතුරු ඇසුරින් 19 සහ 20 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

| වර්ෂය | ස්ථානය | පෘතුගීසි නායකයා |
|---|---|---|
| A 1562 | D ගන්නොරුව | G ජෙරෝ ලොපෙස් ද සූසා |
| B 1594 | E මුල්ලේරියාව | H දියෝගුද මෙලෝ කස්ත්‍රෝ |
| C 1638 | F දන්තුරේ | I අපොන්සු පෙරෙයිරාද ලසර්දා |

(19) පළමුවන විමලධර්මසූරිය රජු හා සම්බන්ධ සටනක් සිදුවූ වර්ෂය ප්‍රදේශය හා පෘතුගීසි නායකයා දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) BDI (2) AFI (3) CEH (4) BFG

(20) දෙවන රාජසිංහ රජු හා සම්බන්ධ සටන සිදුවූ වර්ෂය ප්‍රදේශය හා පෘතුගීසි සේනාවේ නායකයා දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) BEI (2) ADG (3) CDH (4) DCH

(21) ඉන්දියාවේ දේශපාලන බලය පැහිරවීමත් සමඟ ශ්‍රී ලංකාව ඉංග්‍රීසින්ට වඩා වැදගත් වීමට හේතුවූයේ,

(1) ශ්‍රී ලංකාව ආරක්ෂිත ස්ථානයක් වශයෙන් භාවිත කිරීමට ය

(2) ශ්‍රී ලංකාවේ වෙළඳ ආධිපත්‍ය ලබා ගැනීමට ය.

(3) ඉන්දියානු සාගර කලාපයේ වෙළඳ හා නාවික කටයුතු පාලනය කිරීමට ය.

(4) ඉන්දියානු සාගර කලාපය හරහා ගමන් කිරීමේ දී අවශ්‍ය පහසුකම් ලබා ගැනීමට ය.

(22) ලන්දේසීන්ගේ ප්‍රදේශ යටත් කරගැනීමේ දී උඩරට රජුගේ ආධාර ලබා ගැනීමට ඉංග්‍රීසින් එකඟ වුවත් පසුව ආධාර ප්‍රතික්ෂේප කළේ කුමන හේතුව නිසා ද?

(1) උඩරට රජු සමඟ අමනාප වීම නිසා

(2) උඩරට රජු ලන්දේසීන්ගේ කොන්දේසි වලට එකඟ නොවීම නිසා

(3) ලන්දේසි ප්‍රදේශ අත්කර ගැනීමේ වාසිය රජුට ලබාදීමට ඉංග්‍රීසින් අකමැති නිසා

(4) උඩරට රජුගේ කොන්දේසිවලට එකඟවීමට ලන්දේසීන් අකමැති නිසා

(23) - රජු නායක්කර් බසට අවනත වීම

- පිළිමතලව්වේ අදිකාරමට මරණීය දණ්ඩනය දීම

- ජනතාව රජු සමඟ අමනාප වීම

ඉහත කරුණු හේතුකොට ගෙන සිදුවූ අහිතකර ප්‍රතිඵලය කුමක් ද?

(1) ඉංග්‍රීසීන්ට උඩරට ආක්‍රමණය පහසුවීම

(2) උඩරට රාජ්‍යය ඉංග්‍රීසීන්ට යටත් වීම

(3) ජනයා විශාල ප්‍රමාණයක් මියයාම

(4) උඩරට රාජධානිය තුළ විවිධ කැරලි ඇතිවීම

(24) ශ්‍රී ලංකාවේ ජාතික පුනරුදය පිළිබඳ තොරතුරු සහිත යුගල කිහිපයක් පහත දැක්වේ. ඒවායින් නොගැළපෙන යුගලය තෝරන්න.

(1) ටී. බී ජයා - මුස්ලිම් නේෂන් පුවත්පත ආරම්භ කිරීම

(2) පූජ්‍ය වලානේ සිද්ධාර්ථ හිමි - පරමධම්මචේතිය පිරිවෙන ආරම්භ කිරීම

(3) හෙන්රි ස්ටීල් ඔල්කට්තුමා - වෙසක් පොහොය නිවාඩු දිනයක් කිරීම

(4) ධම්මාලංකාර සිරිසුමන තිස්ස හිමි - ලංකෝපකාර මුද්‍රණාලය ආරම්භ කිරීම

(25) මිෂනාරි සමාගම්වල අධ්‍යාපන කටයුතුවලට එරෙහිව දේශීය අධ්‍යාපනය නඟා සිටුවීමට ගන්නා ලද වැදගත්ම ක්‍රියාමාර්ගය වූයේ,

(1) අභාවයට ගිය දේශීය පාසල් නගා සිටුවීමයි.

(2) පොත්, පත්‍රිකා මුද්‍රණය කර බෙදා හැරීමයි.

(3) විදේශවලට යවා ඉංග්‍රීසි අධ්‍යාපනය ලබාදීමයි.

(4) පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය යළි ආරම්භ කිරීමයි.

(26) වර්ෂ 1931 පිහිටවූ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මුලසුන හිමිවූයේ,

(1) රාජ්‍ය ලේකම් වරයාට ය.

(2) ආණ්ඩුකාරවරයාට ය.

(3) කතානායකවරයාට ය.

(4) නීති ලේකම්වරයාට ය.

ඉංග්‍රීසීන්ගේ පොපිමල් ව්‍යාපාරයට එරෙහිව සිදුවූ සූරියමල් ව්‍යාපාරයෙන් ඉහළ මුදල් වියදම් කරන ලද්දේ කුමන කාර්යයක් සඳහා ද?

(1) දේශීය යුධ භටයින්ගේ සුභ සාධනය සඳහා
(2) දේශීය කර්මාන්තය නගා සිටුවීම සඳහා
(3) මෙරට ඉංග්‍රීසි අධ්‍යාපනය නගා සිටුවීම සඳහා
(4) මෙරට දුප්පත් ජනතාවගේ සුභසාධනය සඳහා ය.

පහත සඳහන් තොරතුරු අධ්‍යයනය කොට අංක 28, 29 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

A - වගාව සඳහා අඩි 6000ට වඩා උස්බිම් යෝග්‍ය වීම
B - ලන්දේසි පාලන සමයේ වගාව ආරම්භ වීම
C - ලූල් කඳුර වතුයායේ වගාව ආරම්භ වීම
D - වතු හිමියන්ගෙන් 65%ක් පමණ ලාංකිකයින් වීම
E - හෙමලියා වෙස්ටර්ට්‍රික්ස් රෝගයට ගොදුරු වීම

(28) කෝපි වගාව පිළිබඳ තොරතුරු පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) B සහ E (2) B සහ D (3) A සහ C (4) D සහ E

(29) තේ වගාව පිළිබඳ තොරතුරු පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) A සහ D (2) D සහ E (3) A සහ C (4) B සහ C

(30) වර්ෂ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හඳුන්වා දුන් කරුණු දෙකක් ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) සමර මණ්ඩලය හා පළාත්බද නියෝජනය
(2) ජනමත විචාරණය හා සමානුපාතික නියෝජනය
(3) විධායක ජනාධිපති ක්‍රමය හා සර්වජන ඡන්ද බලය
(4) අග්‍රාණ්ඩුකාරධුරය හා රාජ්‍ය මන්ත්‍රණ සභාව

(31) මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ පළමු අදියර ආරම්භ වූයේ,
(1) පොල්ගොල්ලේ දී මහවැලි ගඟ හරස්කොට අමුණ තැනීමෙනි.
(2) රන්දෙනිගල ජලාශය නිර්මාණය කිරීමෙනි.
(3) වික්ටෝරියා ජලාශය නිර්මාණය කිරීමෙනි.
(4) කඩදොර දී මහවැලි ගඟ හරස් කොට කොත්මලේ ජලාශය තැනීමෙනි.

- පහත දැක්වෙන A හා B ඇසුරෙන් 32 සහ 33 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - නියෝජිතයින් නැත්නම් බදුත් නැත.
B - සාමය, ඉඩම්, ආහාර

(32) ඇමරිකානු නිදහස් සටන සම්බන්ධයෙන්
(1) A හා B සත්‍ය වේ. (2) A හා B අසත්‍ය වේ.
(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

(33) රුසියානු විප්ලවය සම්බන්ධයෙන්
(1) A හා B සත්‍ය වේ. (2) A හා B අසත්‍ය වේ.
[illegible]ය වන අතර B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ

(34) බ්‍රිතාන්‍යයේ ගල් අඟුරු ආකර සහිත ප්‍රදේශ පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) බ්‍රිස්ටල්, ස්වින්ඩන්, යෝක්ෂයර්
(2) ලැන්කෂයර්, යෝක්ෂයර්, සවුත් වේල්ස්
(3) බර්මිංහැම්, ෂෙෆීල්ඩ්, ලිවර්පූල්
(4) ලැම්බත්, සැලිස්බරි, වින්චෙස්ටර්

(35) අකල් යන වේදී පිළී ඉල්ලුම සපුරාලීමට නූල් කැටීම වේගවත් කිරීම සඳහා ප්‍රථමයෙන්ම නිර්මාණය කරන ලද උපකරණය වන්නේ,

(1) ජෝන්කේගේ පියාසර නඩාව
(2) එලියස් හෝව්ගේ මහන මැෂිම
(3) රිචඩ් ආක්රයිට්ගේ ජල රාමුව
(4) ජේම්ස් හාග්‍රීව්ස්ගේ ජෙනී යන්ත්‍රය

- පහත A B C D වලින් දැක්වෙන පද යුගල අධ්‍යයනය කොට 36 - 38 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - 1. භීෂණයේ කාලය
2. ප්‍රංශ විප්ලවය

B - 1. මෙන්ෂෙවික්වරු
2. ජනපද එක්සත් කිරීම

C - 1. රුසියන් විප්ලවය
2. කොමියුනිස්ට් පක්ෂය

D - 1. වර්ජිනියා
2. ජෝර්ජියා

(36) පළමුවැන්නෙහි ආරම්භය හා දෙවැන්නෙහි අවසානය පෙන්වන පද යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

(37) දෙවැන්නෙහි ප්‍රතිඵලයට පළමුවැන්න හේතුවූ පද යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

(38) පළමුවැන්න හා දෙවැන්න අතර සබඳතාවක් නොපෙන්වන පද යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

(39) එක්සත් ජාතීන් සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය කුමක් ද?

(1) මහලේකම් කාර්යාලය ප්‍රධාන පරිපාලන කටයුතු සිදු කරයි.
(2) ලෝක සෞඛ්‍ය සංවිධානය අනුබද්ධ ආයතනයකි.
(3) ආරක්ෂක මණ්ඩලයේ සියලු ම සාමාජිකයින්ට නිෂේධ බලය හිමි ය.
(4) එක්සත් ජාතීන්ගේ භාරකාර මණ්ඩලය අක්‍රියව පවතී.

(40) නොබැඳි පිළිවෙතට සහාය දක්වමින් එය ඉදිරියට ගෙනයාමට කටයුතු කළ යුගොස්ලාවියානු ජනාධිපතිවරයා වූයේ,

(1) මුවම්මර් අල් ගඩාෆිය.
(2) ජවහර්ලාල් නේරු ය.
(3) අබ්දුල් ගමාල් නාසර් ය.
(4) මාර්ෂල් ටිටෝ ය.